# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 55 දරන
# කෘෂිකර්ම රක්ෂණ (සංශෝධන)
# පනත

[සහතිකය සටහන් කළේ 1979 අගෝස්තු මස 30 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 සැප්තැම්බර් 07 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි    තැපැල් ගාස්තුව : ශත 25 යි

# 1979 අංක 55 දරන කෘෂිකර්ම රක්ෂණ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 අගෝස්තු මස 30 වන දින.]

එල්. ඩී.—ඕ. 87/78.

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 27 දරන කෘෂිකර්ම රක්ෂණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1979 අංක 55 දරන කෘෂිකර්ම රක්ෂණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය**

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 27 දරන කෘෂිකර්ම රක්ෂණ පනතේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— **ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 27 දරන පනතේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.**

**"මණ්ඩලය පිහිටුවීම සහ එහි සංයුතිය.**

2. (1) කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය යනුවෙන් හැඳින්විය යුතු (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලයක් පිහිටුවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් මණ්ඩලයට දෙන ලද නාමයෙන් මණ්ඩලය සංස්ථාවක් වන අතර එයට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. එහි සංස්ථා නාමයෙන් මණ්ඩලය විසින් නඩු පැවරීම සහ එම නාමයෙන් මණ්ඩලයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

(3) තුන් දෙනකුට නොඅඩු සහ හත් දෙනකුට නොවැඩි වන්නා වූ ද අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන්නා වූ ද සාමාජිකයන් සංඛ්‍යාවකින් මණ්ඩලය සමන්විත විය යුතු අතර එම සාමාජිකයන්ගෙන්—

(අ) එක් සාමාජිකයකු, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සභාපතිවරයා විසින් නම් කරනු ලබන එම සංස්ථාවේ නිලධරයකු විය යුතු ය ;

(ආ) එක් සාමාජිකයකු, මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා විසින් නම් කරනු ලබන එම බැංකුවේ නිලධරයකු විය යුතු ය ; තව ද

(ඇ) එක් සාමාජිකයකු ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා විසින් නම් කරනු ලබන එම බැංකුවේ නිලධරයකු විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කළ යුතු ය.",

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

" මණ්ඩලයේ සාමාජිකයන් යනාදිහු.

3. (1) සෑම සාමාජිකයකු ම, (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, තමා පත් කරනු ලැබූ දින සිට තුන් අවුරුදු කාලපරිච්ඡේදයක් ධුරය දැරිය යුතු ය:

එසේ වුව ද මිය ගිය හෝ ඉල්ලා අස් වූ හෝ අන්‍යාකාරයකින් ධුරය හිස් කළ සාමාජිකයකු වෙනුවට පත් කරන ලද සාමාජිකයකු, ඔහු කලින් මිය ගියහොත්, ඉල්ලා අස් වුවහොත් හෝ අන්‍යාකාරයකින් ධුරය හිස් කළහොත් මිස, ඔහු යම් සාමාජිකයකුගේ අනුප්‍රාප්තිකයා වන්නේ ද, ඒ සාමාජිකයාගේ ඉකුත් නොවී ඇති ධුර කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(2) අමාත්‍යවරයා වෙත යවන ලිපියක් මගින් යම් සාමාජිකයකුට ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් යම් සාමාජිකයකු හේතුවක් නොදක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර ඒ ඉවත් කිරීම ගැන කිසිම අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු ය; තව ද ඒ ඉවත් කිරීමේ හේතුවෙන් තමාට සිදු වූ යම් අලාභයක් හෝ පාඩුවක් වෙනුවෙන් ඒ සාමාජිකයා කිසිම වන්දියකට හිමිකම් නොලැබිය යුතු ය.

(4) රෝගාතුරවීමේ හෝ වෙනත් අබලතාවක හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හෝ හේතුව නිසා තම ධුරයේ කාර්ය කිරීමට යම් සාමාජිකයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඒ සාමාජිකයා වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(5) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයකින් හා එසේ නිශ්චය කරනු ලබන අනුප්‍රමාණ අනුව මණ්ඩලයේ සියලුම සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවිය යුතු අතර එලෙස ම නිශ්චය කරනු ලබන සේවා කොන්දේසිවලට ඔවුන් යටත් විය යුතු ය.

(6) සාමාජිකයා මිය යාමෙන්, ඉවත් කරනු ලැබීමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ කාලය ඉකුත් වීමෙන් ඒ සාමාජිකයාගේ ධුරය හිස් වන්නේ ය.

(7) ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, සෑම සාමාජිකයෙක් ම නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

(8) මණ්ඩලයේ රැස්වීම් සඳහා ගණපූරණය මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනකු විය යුතු අතර, ඉහත සඳහන් විධිවිධානවලට යටත්ව මණ්ඩලය විසින් ස්වකීය කාර්ය පටිපාටිය විධිමත් කර ගනු ලැබිය හැකි ය.

(9) මණ්ඩලයේ සාමාජික ධුරවල යම් පුරප්පාඩු වක් ඇත්තේ වුව ද මණ්ඩලය විසින් ක්‍රියා කරනු ලැබිය හැකි ය.".